# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1512/8 – 2007 අගෝස්තු 30 වැනි බ්‍රහස්පතින්දා – 2007.08.30

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.බී 51/53 (11).

### රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත

(437 වන අධිකාරය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනතේ 7 වන වගන්තිය යටතේ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

දි. මු. ජයරත්න,
වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා.

2007 අගෝස්තු මස 23 වැනි දින,
කොළඹ දීය.

නියෝග

1. මෙම නියෝග 2007 අංක 01 දරන ස්වභාවික රබර් සඳහා සෙස් බදු නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) සමස්ථයක් ලෙස රබර් කර්මාන්තයට අදාළ වන්නා වූ පිළිගත් කොන්දේසිවලට අනුකූලව නිශ්චිතව සඳහන් කරන ලද පහත දැක්වෙන අනුප්‍රමාණයන්ට අනුකූලව ගණනය කරන ලද හඳුනාගත් රබර් නිෂ්පාදන මත සෙස් බද්දක් අයකරනු ලැබිය යුතුය:-

(අ) එච් එස් ශීර්ෂ අංක 40.07 සිට 40.17 දක්වා වූ එහි උපශීර්ෂ ද ඇතුළුව ආනයනය කරනු ලබන රබර් ආශ්‍රිත නිෂ්පාදන සඳහා සිඅයිඑෆ් වටිනාකම මත රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත සියයට පහක (5%) සෙස් බද්දක් ආනයනය කරනු ලබන අවස්ථාවේ දී ගෙවීම:

(ආ) එච් එස් ශීර්ෂ අංක 40.01 හා උප ශීර්ෂ ද ඇතුළුව අපනයනය කරනු ලබන අමු ස්වභාවික රබර් අපනයනය කිරීමේදී, අපනයනය කරනු ලබන අමු ස්වභාවික රබර්වල වියලි බර කිලෝ ග්‍රෑම් එකකට අපනයනය කරනු ලබන අවස්ථාවේදී රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත රුපියල් 4/- ක සෙස් බද්දක් ගෙවීම;

(ඇ) එච් එස් ශීර්ෂ අංක 40.02, 40.05 හා 40.06 දක්වා වූ එහි උප ශීර්ෂ ද ඇතුළුව අපනයනය කරනු ලබන කෘත්‍රිම රබර්, සංයුක්ත රබර් හා වොල්කනයිස් නොකළ රබර් ද ඇතුළුව රබර් ආශ්‍රිත නිෂ්පාදන සඳහා එහි අඩංගු වියළි ස්වභාවික රබර් ප්‍රතිශතය මත කිලෝ ග්‍රෑම් එකක් සඳහා රු. 4/- ක සෙස් බද්දක් අපනයනය කරනු ලබන අවස්ථාවේදී රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ගෙවීම;

(ඇ) අපනයනය කිරීම සඳහා හෝ දේශීය පරිභෝජනය පිණිස නිෂ්පාදනය කරනු ලබන ස්වාභාවික රබර් ආශ්‍රිත නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමු රබර් මත කිලෝ ග්‍රෑම් එකකට රුපියල් 4/- ක සෙස් බද්දක් එම අමු රබර් මිළදී ගන්නා අවස්ථාවේදී ගෙවීම: එසේ වූ වද, ස්වභාවික රබර් ආශ්‍රිත නිෂ්පාදන සඳහා සාන්ද්‍රික රබර් කිරි මිලදී ගන්නා අවස්ථාවේදී සාන්ද්‍රික රබර් කිරිවලින් සියයට හැටක් (60%) වියළි රබර් අන්තර්ගතය ලෙස ආනයනය කරනු ලැබිය යුතු ය.

1A-G 008788 - 450 (2007/08)

(ඉ) එච් එස් ශීර්ෂ අංක 40.03 සිට 40.04 සහ 40.07 සිට 40.17 දක්වා වූ එහි උප ශීර්ෂයන් ද ඇතුලුව අපනයනය කරනු ලබන රබර් ආශ්‍රිත නිෂ්පාදන වල අඩංගු වියළි ස්වභාවික රබර් කිලෝ ග්‍රෑම් එකකට රුපියල් 4/- ක සෙස් බද්දක් ගෙවීම. එසේ වුව ද, අපනයනය කිරීම සඳහා නිෂ්පාදනය කරනු ලබන ස්වාභාවික රබර් නිෂ්පාදන සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය මත කිලෝ ග්‍රෑම් එකකට රුපියල් 4/- ක සෙස් බද්දක් එම අමු රබර් මිලදී ගන්නා අවස්ථාවේදී ගෙවා ඇත්නම් එම නිෂ්පාදන සඳහා බදු අය නොකළ යුතු ය.

(2) 2 වන නියෝගයේ (1) වන ඡේදයේ (ඈ) උප ඡේදයේ සඳහන් සෙස් බද්ද කර්මාන්තකරුවන් විසින් රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත යටතේ පිහිටුවා ඇති රබර් නැවත වගා කිරීමේ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය. මේ ඡේදයේ සඳහන් කරන ලද "කර්මාන්තකරුවන්" යන්නට රබර් හෝ රබර් ආශ්‍රිත අර්ධ නිමි භාණ්ඩ හෝ රබර් ආශ්‍රිත නිමි භාණ්ඩ නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍යයක් ලෙස රබර් මිලදී ගන්නා පුද්ගලයින් හෝ ආයතන අදහස් විය යුතුය.

(3) (අ) 2 වන නියෝගයේ (1) වන ඡේදයේ (ආ), (ඇ), (ඈ) සහ (ඉ) උප ඡේදවල සඳහන් කරන ලද රබර් නිෂ්පාදනවල අඩංගු රබර්වල සැබෑ ප්‍රතිශතය ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය විසින් පරීක්ෂාකර නිශ්චය කරනු ලැබිය යුතු ය:

(ආ) ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් 2 වන නියෝගයේ (1) වන ඡේදයේ (අ), (ආ), (ඇ) සහ (ඉ) උප ඡේදවල සඳහන් කරන ලද එක් එක් නිෂ්පාදන සඳහා ප්‍රමාණ වගු සකස් කරනු ලැබිය යුතු අතර, එය රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට භාර දෙනු ලැබිය යුතු ය:

(ඇ) 2 වන නියෝගයේ (1) වන ඡේදයේ (අ), (ආ) සහ (ඇ) උප ඡේද යටතේ අයකරනු ලබන සෙස් බද්ද රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත යටතේ පිහිටුවා ඇති රබර් නැවත වගා කිරීමේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය:

(ඈ) (I) 2 වන නියෝගයේ (1) වන ඡේදයේ (ඇ), (ඈ) සහ (ඉ) උප ඡේදවල සඳහන් කරන ලද රබර් ආශ්‍රිත සියලු නිෂ්පාදන අපනයනය කරන සෑම අපනයනකරුවකු විසින්ම අපනයනය කරන ඒ රබර් මිශ්‍රනයේ හෝ නිෂ්පාදනයේ අඩංගු ස්වභාවික රබර් ප්‍රතිශතය රබර් පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත සහ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත සපයනු ලැබිය යුතු ය.

(II) රබර් පර්යේෂණ ආයතනය විසින් අදාළ රබර් නිෂ්පාදනවල අඩංගු රබර් සංයුතිය පිළිබඳ පරීක්ෂා කරනු ලැබිය යුතු අතර, ඉහත ප්‍රකාශනයේ තොරතුරුවල නිරවද්‍යතාවය පිළිබඳ මාස තුනකට වරක් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත සහ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වාර්තා කරනු ලැබිය යුතු ය:

(ඉ) 2 වන නියෝගයේ (1) වන ඡේදයේ (ඈ) උප ඡේදයේ සඳහන් කරන ලද සෙස් බද්ද සැපයුම්කරුවන්ගෙන් අයකර ගනු ලැබිය යුතු අතර, රට තුලින් ස්වභාවික රබර් මිළදී ගන්නා අවස්ථාවේ දී කර්මාන්තකරුවන් විසින් ගෙවනු ලැබිය යුතු ය:

(ඊ) 2 වන නියෝගයේ (1) වන ඡේදයේ (අ), (ආ), (ඇ) සහ (ඉ) උප ඡේදවල සඳහන් කරන ලද එච් එස් ශීර්ෂ අංක 40.01 සිට 40.17 දක්වා වූ රබර් ආශ්‍රිත නිෂ්පාදන අපනයන කරන අවස්ථාවේදී අපනයනය කරන භාණ්ඩවල ප්‍රමාණය, බර සහ ඒවා අපනයනය කරන ආයතනය පිළිබඳ කරුණු ඇතුලත් කරමින් වූ වාර්තාවක් එක් එක් මාසයේ පසළොස් වන දින හෝ ඊට පෙරාතුව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත භාර දෙනු ලැබිය යුතු ය:

(උ) අපනයනය සඳහා හෝ දේශීය පරිභෝජනය සඳහා හෝ රබර් ආශ්‍රිත නිෂ්පාදන නිෂ්පාදනය කරන නිෂ්පාදකයින් විසින් රබර් ආශ්‍රිත නිෂ්පාදනවල ප්‍රභේද, ප්‍රමාණය, බර සහ අපනයනය කරන ලද හෝ එක් එක් මාසයේ දේශීය වෙළෙඳ පලට නිකුත් කරන ලද නිෂ්පාදනවල අඩංගු අමු රබර් ප්‍රමාණය පිළිබඳව කරුණු ඇතුලත් කිරමින් වූ වාර්තාවක් එක් එක් මාසයේ පසළොස්වන වන දින හෝ ඊට පෙරාතුව රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත භාර දෙනු ලැබිය යුතු ය:

(ඌ) මේ නියෝගවල 14 වන නියෝගය යටතේ සාදන ලද ප්‍රකාශයට අනුකූලව මිලදී ගන්නා රබර් කිලෝ ග්‍රෑම් එකක් සඳහා රුපියල් 4/- ක් ලෙස ගණනය කරන ලද සෙස් බදු මුදල එකී ප්‍රකාශනය ද සමග රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත යටතේ පිහිටුවන ලද අරමුදලට බැර කරනු පිණිස එක් එක් මාසයේ පසළොස්වක දිනට පෙරාතුව රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ගෙවනු ලැබිය යුතු ය.

3. රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අය කර ගනු ලබන සෙස් බදු පිළිබඳ මාසික වාර්තාවක් සකස් කරනු ලැබිය යුතු අතර, ඒ මුදල් රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත යටතේ පිහිටුවන ලද අරමුදලට බැර කළ යුතු අතර, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත එය සම්ප්‍රේෂණය කළ යුතු ය.

4. මේ නියෝග යටතේ පනවන ලද සෙස් බද්ද යම් ආනයන බද්දක් හෝ අපනයන බද්දක් හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ අය කර ගන්නා වෙනත් යම් සෙස් බද්දකට අමතරව විය යුතු ය.

5. අමු ස්වාභාවික රබර්, රබර් ආශ්‍රිත නිෂ්පාදන අපනයනකරුවන් සහ ආනයනකරුවන් සහ රබර් ආශ්‍රිත නිෂ්පාදනවල නිෂ්පාදකයින් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කරනු ලැබිය යුතුය. මෙම නියෝගවල "රබර් ආශ්‍රිත නිෂ්පාදන" යන්නට ස්වාභාවික රබර් ආශ්‍රිත නිමි භාණ්ඩ නිෂ්පාදන, අතරමැදි රබර් නිෂ්පාදන සහ අමු ද්‍රව්‍යයක් ලෙසින් වූ රබර් ඇතුලත් විය යුතු ය.

6. (i) රබර් ආශ්‍රිත නිෂ්පාදන නිෂ්පාදනය කරන කර්මාන්තකරුවන් සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි කර ඇත්තාවූ සහතිකයක් ලබා ගැනීමේ කාර්යය සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ද ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(ii) මධ්‍යස්ථ රබර් නිෂ්පාදන එනම්, සියලු වර්ගවල ක්‍රේප් රබර්, කේන්ද්‍ර අපසාරී සාන්ද්‍රිත රබර් කිරි, සංයෝජිත රබර් මිශ්‍රණ නිෂ්පාදනයන් සෙස් බදු ගෙවීමට යටත් නොවිය යුතු ය. සහතිකයක් ලබා ගැනීමේ කාර්ය සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ඔවුන් ලියාපදිංචි විය යුතු ය.

7. අමු ස්වභාවික රබර් සහ රබර් ආශ්‍රිත නිෂ්පාදන, අපනයනකරුවන් සහ රබර් ආශ්‍රිත නිෂ්පාදන නිෂ්පාදකයින් විසින් ලියාපදිංචි වීම සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලිඛිතව ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඔවුන් ලියාපදිංචි කළ යුතු අතර, ලියාපදිංචි කිරීමේ අංකයක් සහිතව සහතිකයක් නිකුත් කළ යුතු ය.

8. එච් එස් ශීර්ෂ අංක 40.01 සිට 40.17 යටතේ වූ නිෂ්පාදන සහ අයිතම වල අපනයනකරුවන් විසින්, 7 වන නියෝගය යටතේ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සපයන ලද ලියාපදිංචි කිරීමේ අංකය, නිශ්චිතව ඒ තුල සඳහන් කර ඇති අයිතම සහ නිෂ්පාදන අපනයනය කරන අවස්ථාවේදී රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලබාදිය යුතුය. ඒ නිෂ්පාදන අධ්‍යයනය කිරීමට අදාල ලියාපදිංචි කිරීම් අංකය ලබා දීමට අපොහොසත් වන යම් තැනැත්තකුට හෝ ආයතනයකට අවසර ලබාදීම රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රතික්ෂේප කළ යුතු ය.

9. ලියාපදිංචිවීම සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත කරන සෑම ඉල්ලීමක්ම, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිශ්චිතව සඳහන් කර ඇති පරිදි ඒ කාර්යය සඳහා ලබා ගත හැකි ආකෘති පත්‍රයක් මගින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

10. හේතු සටහන් කිරීමෙන් පසු රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීම හෝ ඔහු විසින් නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමක් අවලංගු කරනු ලැබිය හැකි ය.

11. ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීමක් රුපියල් දහසක (රුපියල් 1000/-) ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් සමග භාර දෙනු ලැබිය යුතු ය.

12. ලියාපදිංචි කිරීමක් අවුරුදු එකක කාලයක් සඳහා වලංගු විය යුතු අතර (වාර්ෂිකව රුපියල් දහසක (රුපියල් 1000/-) අලුත් කිරීමේ ගාස්තු ගෙවීමෙන්) අලුත් කරනු ලැබිය යුතු ය.

13. (අ) අමු ස්වාභාවික රබර් සහ රබර් ආශ්‍රිත නිෂ්පාදනවල අපනයනකරුවන් සහ ආනයනයකරුවන් සහ රබර් ආශ්‍රිත නිෂ්පාදනවල නිෂ්පාදකයින් විසින් ලියාපදිංචිවීම සඳහා ඉල්ලුම් කරන අවස්ථාවේදී රබර් සහ රබර් ආශ්‍රිත නිෂ්පාදන වල ඇතුලත් රබර්වල සංයුතිය සහ රබර්වල සත්‍ය ප්‍රතිශතය පිළිබඳ ප්‍රකාශයක් කරනු ලැබිය යුතු ය.

(ආ) මේ නියෝගවල (අ) ඡේදය යටතේ වූ තොරතුරු රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පිටපතක් ද සමග රබර් පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත භාර දෙනු ලැබිය යුතු ය.

(ඇ) මේ නියෝගවල (අ) ඡේදයේ සඳහන් කරන ලද නිෂ්පාදනවල සංයුතියේ කිසියම් වෙනස් කිරීමක් සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවසරය ලබා ගත යුතු ය.

14. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සෑම තැනැත්තකු හෝ ආයතනයක් විසින්ම රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කරන ලද ආකෘතියක එක් එක් මාසයේ පසළොස්වක දින හෝ ඊට පෙරාතුව කලින් මාසයේ මිලදී ගත් රබර් පමණය. දැක්වෙන මාසික වාර්තාවක් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

15. අපනයනය සඳහා හෝ දේශීය පරිභෝජනය සඳහා රබර් ආශ්‍රිත නිෂ්පාදන, නිෂ්පාදනය කරන නිෂ්පාදකයින් විසින් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත, කිසියම් නිශ්චිත කාලපරිච්ඡේදයක් තුල දී මිලදී ගත් ස්වභාවික රබර් ප්‍රමාණය පිළිබඳ තොරතුරු භාර දීම සහ සැපයීම කරනු ලැබිය යුතු ය.

16. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තත්කාර්ය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් ලබා ගැනීමෙන් තොරව කිසියම් තැනැත්තකු හෝ කිසියම් ආයතනයක් විසින් ස්වභාවික රබර් වෙළෙඳාමට සම්බන්ධ වීම නීතිවිරෝධී කටයුත්තක් විය යුතු ය.

17. මෙම නියෝග යටතේ ලියාපදිංචි කරන ලද යම් තැනැත්තකු හෝ යම් ආයතනයක් විසින් සපයන ලද තොරතුරුවල නිරවද්‍යභාවය පිළිබඳව, කලින් කලට රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ රබර් පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා හෝ ඔවුන්ගේ බලයලත් අනුයෝජිතයන් විසින් සහතික කරනු ලැබිය යුතු ය.

18. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මෙම නියෝග යටතේ ලියාපදිංචි කරන ලද යම් තැනැත්තෙකු හෝ ආයතනයක් විසින් සපයන ලද තොරතුරු විගණනය කිරීම සඳහා විගණන මණ්ඩලයක් පත් කරනු ලැබිය යුතු ය. ඒ තැනැත්තන් හෝ ආයතන විසින් සපයන ලද තොරතුරු රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අභිමතය පරිදි එකී විගණකවරයන් විසින් විගණනය කරනු ලැබිය යුතුය.

19. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා හෝ ඔවුන්ගේ බලයලත් අනුයෝජිතයින් විසින් කාර්මාන්ත ශාලා, අදාල ගොඩනැගිලි සහ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කල බලපත්‍රවලට අදාල වන ලේඛන පරීක්ෂා කරනු ලැබිය යුතුය.

20. සියලු පළාත් පාලන ආයතන විසින් අමු ස්වාභාවික රබර් සහ රබර් ආශ්‍රිත නිෂ්පාදන අපනයනයකරුවන් සහ ආනයනයකරුවන් වෙත සහ රබර් ආශ්‍රිත නිෂ්පාදනවල නිෂ්පාදකයින් වෙත අදාල වෙළෙඳ ලියාපදිංචි කිරීම් හෝ බලපත්‍ර නිකුත් කිරීමට පෙරාතුව රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඒකඟතාවය ලබා ගත යුතු අතර, ඒ බලපත්‍ර නිකුත් කිරීමෙන් පසුව රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත එය දැන්විය යුතු ය.

21. මේ නියෝගවල සඳහන් විධිවිධාන කඩ කරනු ලබන තැනැත්තකු හෝ ආයතනයක් පනතට අනුව වරදකරුවකු විය යුතු අතර, ඒ අනුව දඬුවම් කරනු ලැබිය යුතු ය.

09-500

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1,518/18 – 2007 ඔක්තෝබර් 10 වැනි බදාදා – 2007.10.10

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදි)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

නිවැරදි කිරීම

රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත

රජයේ අති විශෙෂ ගැසට් අංක 1512/8-2007.08.30 දරන (437 වන අධිකාරය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනතේ 7 වන වගන්තිය යටතේ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග පහත සඳහන් පරිදි නිවැරදි විය යුතු ය.

දි. මු. ජයරත්න,
වැවිලි කර්මාන්ත අමාත්‍ය.

2007 ඔක්තෝබර් මස 08 වැනි දින,
කොළඹ දී ය.

නිවැරදි කිරීම්

1. 1A පිටුවේ 2 වන නියෝගයේ (1) වන ඡේදයේ (ඇ) උප ඡේදයේ (අවසාන පෙළ) ''ආනයනය'' යන්න ''ආගණනය'' ලෙස නිවැරදි විය යුතුය.

2. 2A පිටුවේ 2 වන නියෝගයේ (2) වන ඡේදයේ (ඇ) උප ඡේදයේ (ii) කොටසේ (දෙවන පෙළ) ''නිරවද්‍යාතාවය'' යන්න ''නිරවද්‍යතාවය'' ලෙස නිවැරදි විය යුතුය.

3. 2A පිටුවේ 2 වන නියෝගයේ (2) වන ඡේදයේ (උ) උප ඡේදයේ (තෙවන පෙළ) ''කිරමින්'' යන්න ''කරමින්'' ලෙස නිවැරදි විය යුතු ය.

4. 2A පිටුවේ 2 වන නියෝගයේ (2) වන ඡේදයේ (ඌ) උප ඡේදයේ (තෙවන පෙළ) සහ 3A පිටුවේ 14 වන නියෝගයේ (දෙවන පෙළ) ''පසළොස්වක දින'' යන්න ''පසළොස්වන දින'' ලෙස නිවැරදි විය යුතු ය.

5. 3A පිටුවේ 8 වන නියෝගයේ (තෙවන පෙළ) ''අධ්‍යයනය'' යන්න ''අපනයනය'' ලෙස නිවැරදි විය යුතු ය.

6. 3A පිටුවේ 12 වන නියෝගයේ ''(වාර්ෂිකව රුපියල් දහසක (රුපියල් 1,000) අලුත් කිරීමේ ගාස්තු ගෙවීමෙන්)'' යන්න ''වාර්ෂිකව රුපියල් දහසක (රුපියල් 1,000) අලුත් කිරීමේ ගාස්තු ගෙවීමෙන්'' ලෙස නිවැරදි විය යුතු ය. (වරහන් ඉවත් විය යුතුය).

7. 3A පිටුවේ 14 වන නියෝගයේ (අවසාන පෙළ) ''පමණය'' යන්න ''ප්‍රමාණය'' ලෙස නිවැරදි විය යුතු ය.

10-765

1A-G 008958 - 855 (2007/10)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදි.